කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2011
2012 දෙසැම්බර් / 2013 ජනවාරි

මානවශාස්ත්‍ර පීඨය

බෞද්ධ සංස්කෘතිය - BUCU E 2015

බෞද්ධ කලා, පුරාවස්තු හා භික්ෂු භික්ෂුණී සංස්ථා

කොටස් දෙකෙන් ම ඇතුලත් වන පරිදි ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි | කාලය : පැය 03 යි

---

## 1 කොටස

01. බුදුරදුන් විසින් අනුදැන වදාළ ආරාම හා ආවාස නිර්මාණයන්හි වාස්තු විද්‍යාත්මක ලක්ෂණ මූලාශ්‍රය ඇසුරින් පරීක්ෂා කරන්න.

02. ස්තූප නිර්මාණයේ පසුබිම හඳුන්වා භාරතීය ස්තූපයේ ස්වරූපය නිදසුන් මගින් පෙන්වා දෙන්න.

03. බුද්ධ ප්‍රතිමා නිර්මාණය සියවස් ගණනක් පමාවීමට බල පෑ හේතුයුක්තීන් පැහැදිලි කොට එම වකවානුව තුළ බුදුන් නිරූපිත වූ ආකාරය පරීක්ෂා කරන්න.

04. බුද්ධ ප්‍රතිමාව හා ස්තූපය, ශ්‍රී ලාංකේය අනන්‍යතාවකින් යුක්තව මෙරට නිර්මාණය වූ ආකාරය නිදසුන් මගින් සාකච්ඡා කරන්න.

05. මහනුවර යුගයේ බෞද්ධ චිත්‍ර කලාවේ ශෛලිය, සම්ප්‍රදාය හා වස්තුවිෂය පිළිබඳ සමාලෝචනයක් කරන්න.

## 11 කොටස

06. මුල් විසිවස තුළ භික්ෂු සමාජය ප්‍රඥප්ති විරහිතව පැවතීමට පදනම් වූ කරුණු සහේතුකව දක්වන්න.

07. බෞද්ධ පැවිද්දේ හා උපසම්පදාවේ ක්‍රම විකාශය ත්‍රිපිටක මූලාශ්‍රය ඇසුරින් සකච්ඡා කරන්න.

08. භික්ෂුණීන් උදෙසා අට්ඨගරුධම්මපටිග්ගහන උපසම්පදාව පැණවීමේ හේතුයුක්ති පිළිබඳ විමසීමක් කරන්න.

09. සාමූහික භික්ෂු ජීවිතයේ යහපැවැත්ම උදෙසා මනා ආරාම පරිපාලනයක් හා කළමනාකරණයක් පවත්වාගෙන යෑමේ වැදගත්කම බුදුරදුන් විසින් පෙන්වා දී ඇති ආකාරය අධ්‍යයනය කරන්න.

10. මාතෘකා දෙකකට (02) ප්‍රමාණවත් විස්තර සපයන්න.

    1. උපාධ්‍යාය හා සද්ධිවිහාරික වත්
    2. භික්ෂුණී ප්‍රාතිමොක්ෂය
    3. කිච්චාධිකරණ
    4. පසේනදි කෝසල රජතුමා

******************************